ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026.06.11 |

එස්.චමින්ද කුමාර ප්‍රනාන්දු,
අංක 103/10, නුගේ මාවත, පරත්ත,
කෙසෙල් වත්ත, පානදුර

*පැමිණිලි පාර්ශවය*

උදාර සඳකැලුම් ප්‍රනාන්දු - අවුරුදු 17
චතුර සඳරුවන් ප්‍රනාන්දු - අවුරුදු 15
මේනකා ප්‍රියදර්ශනී - අවුරුදු 36
නිනුද සඳරුවන් ප්‍රනාන්දු - අවුරුදු 03

*වින්දිත පාර්ශවය*

*එදිරිව*

1. සංජීව ලක්මාල් මයා
   හිටපු ස්ථානාධිපති,
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

2. කා.උ.පො.ප. පත්මිණී මිය
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

3. උ.පො.ප. ප්‍රියංකර මයා
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

4. උ.පො.ප. සෙනෙවිරත්න මයා
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

5. පො.සැ. 44659 වීරසේකර මයා
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

6. පො.කො. 86409 මධුරංග මයා
   පොලිස් ස්ථානය, පානදුර උතුර.

*වගඋත්තර පාර්ශවය*

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk



ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1869-21

**<u>පැමිණිලි අංකය - එච්.ආර්.සී /1869/21</u>**

**<u>පැමිණිල්ල</u>**

පැමිණිලිකරු විසින් 2021.08.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත තැපැල් මාර්ගයෙන් යොමු කරන ලද පැමිණිල්ල මඟින් පහත කරුණු ඉදිරිපත් කර ඇත. පැමිණිලිකරු 2021.06.28 වන දින පවුල් ආරවුලක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සිය බිරිඳ සමඟ සහෝදරියගේ නිවස වෙත ගිය අවස්ථාවේ දී ඇති වූ වචන හුවමාරුවක් අතරතුර සහෝදරියගේ දියණිය විසින් එල්ල කරන ලද ඇස්බැස්ටස් කැබැල්ලක් සහෝදරියගේ නළල ප්‍රදේශයේ වැදී ඇය තුවාල ලැබූ බවත්, අනතුරුව එම සහෝදරිය රෝහල්ගත වී ඇති අතර, පැමිණිලිකරු විසින් ඇයට කඩුවකින් පහර දුන් බව පවසමින් පානදුර උතුර පොලිස් ස්ථානය වෙත අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ බවත් සඳහන් කර ඇත.

එකී පැමිණිල්ලට අදාළව පානදුර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට ඔහුගේ නිවස වෙත ගිය ද එම අවස්ථාවේ ඔහු එහි රැඳී නොසිටි බැවින්, නිලධාරීන් ආපසු ගොස් නැවතත් පිරිසක් සමඟ පැමිණි අවස්ථාවේ ද, පැමිණිලිකරු නිවසේ නොසිටීම හේතුවෙන්, පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත කැඳවා ගැනීමේ අරමුණින් නිවසේ රැඳී සිටි ඔහුගේ බාලවයස්කාර පුත්‍රයන් දෙදෙනා වන උදාර සඳකැලුම් ප්‍රනාන්දු (වයස 17) සහ චතුර සඳරුවන් ප්‍රනාන්දු (වයස 15) යන දෙදෙනාව පොලිස් භාරයට ගෙන, පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් සිරමැදිරිය තුළ රඳවා තැබීමට පොලිසිය කටයුතු කර ඇති බවයි.

තවද, සිය දරුවන් රඳවා සිටින බව දැනගැනීමෙන් පසුව පැමිණිලිකරුගේ බිරිඳ පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී, එහි සිටි පද්මිණී නැමැති නිලධාරිනිය ඇයට කොස්සකින් පහර දී, සිරමැදිරිය ආසන්නයේ වූ බංකුවක බලහත්කාරයෙන් වාඩි කරවා රඳවා තැබූ බවත්, ඒ සමඟම ඇය සමඟ සිටි පැමිණිලිකරුගේ වයස අවුරුදු තුනක් (03) වූ බාල පුත්‍රයා වන තිනුද සඳරුවන් ප්‍රනාන්දු ද මව සමඟ පොලිස් ස්ථාන පරිශ්‍රයේ රඳවා තැබීමට පොලිසිය කටයුතු කළ බවයි. එදින පස්වරු 2.00 ට පමණ ඔහු පානදුර උතුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වූ පසුව, එලෙස අත්තනෝමතික ලෙස රඳවා සිටි ඔහුගේ බිරිඳ සහ දරුවන් තිදෙනා නිදහස් කිරීමට පොලිසිය පියවර ගත් බවයි. පසුව 2021.06.29 වන දින අංක 84875/21 දරන නඩුකරය යටතේ පැමිණිලිකරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදා හැර ඇති බව පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වේ.

තමා වෙනුවට සිය පාසල් යන වියේ පසුවන පුතුන් සහ බිරිඳ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තැබීම සම්බන්ධයෙන් 2021.08.31 වන දින පානදුර පොලිස් අධිකාරී කාර්යාලය වෙත ගොස් පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවයි. එකී පැමිණිල්ල ඉදිරිපත් කර පොලිස් අධිකාරී කාර්යාලයෙන් පිටතට පැමිණෙන අවස්ථාවේදී, පානදුර උතුර පොලිස් ස්ථානාධිපතිවරයා ඔහු අමතා මෙම සිදුවීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට උත්සාහ කළහොත් දැනට පවරා ඇති අපරාධ නඩුවට ඔහුගේ බිරිඳ, පුතුන් දෙදෙනා සහ ඔහු සතු ත්‍රිරෝද රථය ද ඇතුළත් කරන බවට තර්ජනාත්මක අයුරින් ප්‍රකාශ කළ බවයි.

පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් මෙතෙක් නිසි විමර්ශනයක් හෝ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති පසුබිමක, කිසිදු වරදකට සම්බන්ධ නොවූ සිය බාලවයස්කාර දරුවන් සහ බිරිඳ අත්තනෝමතික ලෙස ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා තබා ගැනීමෙන් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි. ඒ අනුව, මෙම සිදුවීමට වගකිව යුතු පානදුර උතුර පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන්ට එරෙහිව නිසි නීතිමය ක්‍රියාමාර්ග ගෙන සාධාරණය ඉටු කරන ලෙස පැමිණිලිකරු මෙම පැමිණිල්ලේ සහනය ලෙස අපේක්ෂා කර ඇත.

## වගඋත්තර කරුවන්ගේ කරුණු දැක්වීම -

1. පළමු වගඋත්තර - වී.කේ. සංජීව ලක්මාල් විජේවීර (හිටපු ස්ථානාධිපති - පානදුර උතුර පොලිස් ස්ථානය)

2025.02.27 වන දින පවත්වන ලද විමර්ශනයේදී, අදාළ සිදුවීමට පදනම් වූ පහරදීමේ සිද්ධිය සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ලැබී තිබූ බැවින්, ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් පවත්වා සැකකරු අත්අඩංගුවට ගැනීමටත්, අපරාධය සඳහා භාවිතා කළ බව කියන කඩුව නඩු භාණ්ඩයක් වශයෙන් භාරයට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමටත් තමා නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බව සඳහන් කර ඇත. ඔහු 2021.06.12 වන දින පානදුර උතුර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් රාජකාරි භාරගැනීමෙන් අනතුරුව, ප්‍රදේශයේ මහා සංඝරත්නය විසින් අපරාධ වැළැක්වීම සඳහා නීතිය දැඩිව ක්‍රියාත්මක කරන ලෙස තමාගෙන් ඉල්ලීම් කර තිබූ බවත්, එකී පසුබිම මත අදාළ සිදුවීම සම්බන්ධයෙන් විධිමත් පරිදි නීතිය ක්‍රියාත්මක කිරීමට තමා අවශ්‍ය නියෝග නිකුත් කළ බව සඳහන් කර ඇත.

පැමිණිලිකරු වන 'චමින්ද' නැමැති අය පොලිස් ස්ථානය වෙත පැමිණීමෙන් පසු ඔහුට එරෙහි චෝදනා පැහැදිලි කර දී ඔහුව අත්අඩංගුවට ගත් බවත්, අපරාධය සඳහා යොදා ගත් ආයුධය පිළිබඳව විමසීමේදී ඔහුගෙන් නිශ්චිත පිළිතුරක් නොලැබුණු බවත් වගඋත්තරකරු සඳහන් කර ඇත. ඒ අනුව 2021.06.28 වන දින පැය 18.10 ට පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන, 2021.06.29 වන දින පැය 10.35 ට අංක B 84875/2021 යටතේ පානදුර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ බව ඔහු තවදුරටත් අනාවරණය කළේය. තමා සහ පැමිණිලිකරු අතර කිසිදු පෞද්ගලික අමනාපයක් නොමැති බවත්, මෙම සිදුවීමෙන් පසුව ද පොලිස් ස්ථානය වෙත වාර්තා වූ වෙනත් පැමිණිලි සම්බන්ධයෙන් ඔහු සමඟ සහයෝගයෙන් කටයුතු කළ බවත් සඳහන් කර ඇත.

විමර්ශන අවස්ථාවේදී ඉදිරිපත් වූ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දෙමින්, පැමිණිලිකරු පොලිස් ස්ථානය වෙත කැඳවීමට කටයුතු කළ නිලධාරීන් පිළිබඳව තමා නිශ්චිතව නොදන්නා නමුත්, පොලිස් ස්ථානයේ නිල දුරකථන අංකයෙන් පැමිණිලිකරු අමතා පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දැනුම් දීමක් සිදුකර ඇති බවත්, යම් පැමිණිල්ලකට අදාළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවක් පවතින විට, ඒ වෙනුවට එම පුද්ගලයාගේ ඥාතීන් අත්අඩංගුවට ගැනීමට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් නොමැති බව සඳහන් කරමින් දරුවන් අත් අඩංගුවට ගැනීමේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත. එසේම, පැමිණිලිකරුගේ ඥාතීන් වන ඔහුගේ පුතුන් හෝ බිරිඳ අත්අඩංගුවට ගන්නා ලෙස තමා කිසිදු අවස්ථාවක ලිඛිත හෝ වාචික නියෝගයක් ලබා දී නොමැති බවත්, පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීමේ ලේඛනයන්හි එවැනි කිසිදු සටහනක් ඇතුළත් කර නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

02. දෙවන වගඋත්තර - කාන්තා පොලිස් පරීක්ෂක කේ. පත්මිණී

2025.01.17 සහ 2025.02.27 යන දිනයන්හි පවත්වන ලද විමර්ශනයන්හිදී කරුණු දක්වමින්, අදාළ සිදුවීම සිදු වූ දිනයේ ඇය පානදුර උතුර පොලිස් ස්ථානයේ රාජකාරි භාර නිලධාරිනිය වශයෙන් සේවය කළ බවත්, පැමිණිලිකරු විසින් තමාට එරෙහිව එල්ල කර ඇති චෝදනා තරයේ ප්‍රතික්ෂේප කළ ඇය, පැමිණිලිකරුගේ බිරිඳට කිසිදු ආකාරයක පහරදීමක් සිදු නොකළ බවත්, මෙම විමර්ශනය පවත්වන දිනය දක්වාම තමා පැමිණිලිකරුගේ බිරිඳ දැක නොමැති බවත් සඳහන් කර ඇත. එසේම, පැමිණිලිකරු සිය පුත්‍රයෙකු සමඟ පොලිස් ස්ථානය වෙත පැමිණි බවට වන කරුණ ද ඇය මෙහිදී ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරුගේ පුතුන් දෙදෙනෙකු පොලිස් ස්ථානයේ සිරමැදිරිය තුළ රඳවා තැබීමට කටයුතු කළ බවට වන චෝදනාව ද බැහැර කරමින්, පොලිස් ස්ථානයේ භෞතික පිහිටීම පිළිබඳව කරුණු

දක්වමින් පෙන්වා දී ඇත්තේ ස්ථානාධිපතිවරයාගේ නිල කාමරය සහ ඇය රාජකාරි කරනු ලබන කාමරය අතර යම් දුරක් පවතින බවයි. පැමිණිලිකරුගේ බිරිඳට 'කොස්සකින්' පහර දුන් බවට වන චෝදනාව සම්බන්ධයෙන් කරුණු දක්වමින්, ඇය රාජකාරි කරනු ලබන උඩු මහලේ කොසු නොමැති බවත්, පහරදීමේ අරමුණින් වෙනත් මහලක ඇති කොසු රැගෙන ඒමට තමාට කිසිදු අවශ්‍යතාවයක් නොතිබූ බවත්ය.

පැමිණිලිකරු නිරන්තරයෙන් පොලිස් ස්ථානය වෙත පැමිණෙන පුද්ගලයෙකු බැවින් තමා ඔහුව හොඳින් හඳුනන බවත්, වත්මන් ස්ථානාධිපතිවරයාට වඩා වැඩි කාලයක් තමා මෙම පොලිස් ස්ථානයේ රාජකාරි කර ඇති බැවින් පැමිණිලිකරු පිළිබඳව මනා අවබෝධයක් පවතින බවත් ඇය සඳහන් කර ඇත. පැමිණිලිකරු යනු ඔහු සමඟ සමීපව කටයුතු කරන වෙනත් පාර්ශවයන්ගේ සහාය ඇතිව සිය දරුවන් සිරමැදිරියක සිටින අයුරු නිරූපණය වන පරිදි ව්‍යාජ දර්ශන (වීඩියෝ) පවා සකස් කරගත හැකි මට්ටමේ පුද්ගලයෙකු බවත් සඳහන් කර ඇත.

03. තෙවන වගඋත්තර - උප පොලිස් පරීක්ෂක කේ.බී නිහාල් ප්‍රියංකර

2025.02.27 වන දින පවත්වන ලද විමර්ශනයේදී කරුණු දක්වමින්, ඔහු 2021.05.22 දින සිට 2021.07.03 දින දක්වා මාස එකහමාරක (1 ½) කාලසීමාවක් පානදුර උතුර පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කර ඇති බවත්, 2021.06.28 වන දින කාන්තාවකට කඩුවකින් පහරදීමක් සිදුකිරීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ලකට අදාළව, ස්ථානාධිපතිවරයාගේ උපදෙස් පරිදි අපරාධය සිදු වූ ස්ථානය නිරීක්ෂණය කර අදාළ සටහන් තැබීමට ඔහු කටයුතු කර ඇත. එහිදී එම ස්ථානයේ රැඳී සිටි කුඹුක්ගේ දොන් කුමුදුනී උපේක්ෂා යන අයගේ ප්‍රකාශය සටහන් කරගත් බවත්, පස්වරු 17.00 ට නැවත පොලිස් ස්ථානය වෙත පැමිණි බවත් සඳහන් කර ඇත.

ඔහු අපරාධය සිදු වූ ස්ථානයේ රැඳී සිටි අවස්ථාවේදී, අදාළ සිද්ධියට සම්බන්ධ සැකකරු පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බැවින් ඔහුව අත්අඩංගුවට ගන්නා ලෙස ස්ථානාධිපතිවරයා තමාට දැනුම් දුන් බව ඔහු සඳහන් කර ඇත. ඒ අනුව, සිංගප්පුලිගේ චමින්ද කුමාර ප්‍රනාන්දු යන අයව පස්වරු 18.10 ට අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට තමා කටයුතු කළ බවයි. සිය රාජකාරි සටහන් පිළිබඳව පැහැදිලි කරමින්, පස්වරු 14.10 ට පිටවීමේ සටහන් යොදා පස්වරු 14.40 ට අදාළ ස්ථානයට ගිය බවත්, තමා ගියේ සිද්ධිය වූ ස්ථානයට මිස පැමිණිලිකරුගේ නිවස වෙත නොවන බවත්ය. එබැවින් සිය සටහන් තුළ සැකකරු නිවසේ නොසිටි බවට වන කිසිදු සටහනක් ඇතුළත් කර නොමැති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

04. හතරවන වගඋත්තර - උප පොලිස් පරීක්ෂක අජිත් ලක්ෂ්මන් ඇපා සෙනෙවිරත්න

2025.02.27 වන දින පවත්වන ලද පරීක්ෂණයේදී, 2021.06.28 වන දින තමා උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර මහතා සමඟ රියදුරු වශයෙන් රාජකාරි කටයුතු සිදු කළ බවත්, අදාළ රාජකාරිය අතරතුර තමා පොලිස් ජීප් රථය තුළම රැඳී සිටි බවත්, එම අවස්ථාවේදී වින්දිත බාලවයස්කාර දරුවන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බවත් සඳහන් කර ඇත.

05. පස්වන වගඋත්තර - පොලිස් සැරයන් 44659 කුමාරගේ වානක වීරසේකර

2025.02.27 වන දින පවත්වන ලද පරීක්ෂණයේදී කරුණු දක්වමින්, තමා පානදුර උතුර පොලිස් ස්ථානයට අනුයුක්තව දීර්ඝ කාලයක් රාජකාරි කරන බැවින් අදාළ ප්‍රදේශය සහ ප්‍රදේශවාසීන් පිළිබඳව මනා අවබෝධයක් පවතින බවයි. එසේ වුවද, පැමිණිලිකරුගේ නිවස පිහිටි නිශ්චිත ස්ථානය ප්‍රකාශ කිරීමට තරම් මතකයක් නොමැති බවත්, කිසිදු අවස්ථාවක පැමිණිලිකරුගේ බාලවයස්කාර දරුවන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමක් සිදු නොකළ බවත් ඔහු එහිදී අවධාරණය කළේය. තවද, පැමිණිලිකරුට පහරදීමක් සිදු නොකළ බවත්, ඔහු අත්අඩංගුවට ගෙන තිබුණේද යන්න පිළිබඳව තමා නිශ්චිතව නොදන්නා බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද, 2025.10.02 වන දින පවත්වන ලද විමර්ශනයේදී මොහු විසින් ලබා දෙන ලද ප්‍රකාශය, මීට පෙර ලබා දුන් ප්‍රකාශයට වඩා සැලකිය යුතු පරස්පරතාවයක් පෙන්නුම් කරන ලදී. එහිදී ඔහු පිළිගනු ලැබුවේ සිද්ධිය වූ අවස්ථාවේදී තමා '119' හදිසි ඇමතුම් සේවාවට අදාළ රාජකාරි සහ ස්ථානාධිපතිවරයා විසින් පවරන ලද අනෙකුත් රාජකාරි සිදු කළ බවත්, එම අවස්ථාවේදී දරුවන් දෙදෙනෙකු පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බව තමාට මතක බවත්ය. අදාළ දරුවන් දෙදෙනා පොලිස් ස්ථානය වෙත රැගෙන එන ලද්දේ තමා සහ තවත් නිලධාරියෙකු විසින් බවත්, ඔවුන්ව ස්ථානාධිපතිවරයා වෙත භාර දීමට කටයුතු කළ බවත් ඔහු එහිදී පිළිගත්තේය. එහෙත්, ඔවුන් අත්අඩංගුවට ගත් ස්ථානය හෝ ඔවුන් පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමට බලපෑ නිශ්චිත හේතුව පිළිබඳව තමා නොදන්නා බව සඳහන් කර ඇත.

මීට පෙර කොමිෂන් සභාව හමුවේ ලබා දුන් ප්‍රකාශය සහ මෙම නව ප්‍රකාශය අතර පවතින පරස්පරතාවය පිළිබඳව විමසනු ලැබූ අවස්ථාවේදී, වගඋත්තර කරු සඳහන් කර සිටියේ තමා එම දරුවන් දෙදෙනා "අත්අඩංගුවට ගැනීමක්" සිදු නොකළ බවත්, එහෙත් ඔවුන්ව පොලිස් ස්ථානය වෙත රැගෙන ඒමේ ක්‍රියාවලිය සඳහා සහභාගී වූ බවත්ය.

6. හයවන වගඋත්තර - පොලිස් කොස්තාපල් 86409 එච්.එම් නුවන් මධුරංග

2025.02.27 වන දින පවත්වන ලද විමර්ශනයේදී කරුණු දක්වමින්, පැමිණිල්ලට අදාළ දින පස්වරු 18.15 ට තමා රාත්‍රී උපසේවා නිලධාරියා වශයෙන් රාජකාරිය සඳහා වාර්තා කළ බවයි. ඒ අනුව, එදින පස්වරු 18.35 ට උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර මහතා විසින් පැමිණිලිකරුව තමා වෙත භාර දුන් බවත්, රඳවා තබා ගැනීමේ ලේඛනයෙහි අනු අංක 1162 යටතේ ඊට අදාළ තොරතුරු නිසි පරිදි වාර්තා කිරීමට තමා කටයුතු කළ බවයි.

තවද, තමා රාජකාරිය භාරගනු ලැබුවේ පස්වරු 18.15 ට බැවින්, ඊට පෙර කාලසීමාව තුළ එනම් උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර මහතා පස්වරු 17.00 ට පොලිස් ස්ථානය වෙත පැමිණි අවස්ථාවේ සිට සිදුවූ කිසිදු කරුණක් පිළිබඳව තමා දැනුවත්භාවයක් නොමැති බවයි.

<u>නිරීක්ෂණ -</u>

1. පැමිණිලිකරු අපරාධ විමර්ශනයකට අදාළව සැකකරුවෙකු වශයෙන් නම් කර තිබිය දී, ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා පදිංචි නිවස වෙත ගිය පානදුර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්, එම අවස්ථාවේ පැමිණිලිකරු නිවසේ රැඳී නොසිටීම හේතුවෙන් ඔහු වෙනුවට ඔහුගේ බාලවයස්කාර පුත්‍රයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන පොලිස් සිරමැදිරිය තුළ රඳවා තබා ඇති බවත්, ඔවුන් බැලීමට පැමිණි බිරිඳ සහ වයස අවුරුදු තුනක බාල දරුවා ද පොලිස් ස්ථාන පරිශ්‍රය තුළින් පිටවීමට නොදී රඳවා තබාගත් බව පැමිණිල්ල මඟින් සඳහන් කර ඇත.

2. පානදුර උතුර පොලිස් ස්ථානයේ සිරමැදිරිය තුළ බාලවයස්කාර දරුවන් දෙදෙනා රඳවා තැබූ බවට වන චෝදනාව, එම කාලසීමාව තුළ සිරමැදිරියේ රැඳවුම් භාරයේ සිටි අනිල් ප්‍රදීප් මොරායස් සහ සුදත් හේමන්ත යන ස්වාධීන සාක්ෂිකරුවන් දෙදෙනාගේ දිවුරුම් ප්‍රකාශ මඟින් සනාථ වේ. අනිල් ප්‍රදීප් මොරායස්ගේ දිවුරුම් ප්‍රකාශයට අනුව, 2021.06.28 වන දින පෙරවරු 10.00 ට පමණ වයස අවුරුදු 14 ක් සහ 15 ක් පමණ වන පිරිමි දරුවන් දෙදෙනෙකු සිරමැදිරිය වෙත රැගෙන විත් ඇත. සාක්ෂිකරු වන සුදත් හේමන්ත ද එකී කරුණ සනාථ කරමින් කියා සිටින්නේ, එම දරුවන් සමඟ කළ කතාබහේදී ඔවුන්ගේ පියා වෙනුවට තමන්ව අත්අඩංගුවට ගත් බව ඔවුන් ප්‍රකාශ කළ බවයි. සාක්ෂිකරුවන් දෙදෙනාම එකී කරුණු දිවුරුම් මත තහවුරු කිරීමත්, පියා (පැමිණිලිකරු) සිරමැදිරියට රැගෙන ආ වහාම දරුවන් දෙදෙනා නිදහස් කිරීමට පොලිසිය කටයුතු කළ බව සඳහන් කිරීමත් තුළින් මෙම රඳවා තැබීමේ අත්තනෝමතිකභාවය පිළිඹිබු වේ. පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක A20 (5)(D) මඟින් බාලවයස්කාර පුද්ගලයන් වැඩිහිටි රැඳවියන් සමඟ රඳවා තැබීම තහනම් කර තිබියදී, මෙම

දරුවන් දෙදෙනා වැඩිහිටි සිරකරුවන් සමඟ සිරමැදිරිය තුළ රඳවා තැබූ බවට අනිල් ප්‍රදීප් සහ සුදත් හේමන්ත යන අයගේ දිවුරුම් ප්‍රකාශ මඟින් සනාථ වේ.

වින්දිත දරුවන් දෙදෙනා සිය නිවසේ රැඳී සිටියදී අත්අඩංගුවට ගත් බව ඔවුන්ගේ සීයා වන 70 හැවිරිදි ෂෙල්ටන් ප්‍රනාන්දු මහතාගේ දිවුරුම් ප්‍රකාශය මඟින් තහවුරු වේ. ඔහු දිවුරුම් ප්‍රකාශයක් මඟින් සාක්ෂි දෙමින් පොලිස් නිලධාරීන් පැමිණ සිය මුණුබුරන් දෙදෙනා රැගෙන ගිය බව සඳහන් කර ඇත. එමෙන්ම අසල්වැසියෙකු වන ශ්‍රී ලාල් ප්‍රනාන්දු, පෙරවරු 9.30 ත් 10.00 ත් අතර කාලයේදී දරුවන් දෙදෙනා පොලිස් ජීප් රථයේ පිටුපස අසුනේ සිටිනු දුටු බවට ලබා දී ඇති සාක්ෂිය මඟින් දරුවන් නිවසින් රැගෙන ගිය බවට වන කරුණ තවදුරටත් සනාථ වේ. මෙය වගඋත්තර  නිලධාරීන් විසින් කරනු ලබන ප්‍රතික්ෂේප කිරීම් අසත්‍ය බව තහවුරු කරන සාක්ෂියකි.

වින්දිත බාලවයස්කාර දරුවන් වන උදාර සඳකැලුම් සහ චතුර සඳරුවන් විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයන්ට අනුව, ඔවුන්ව පොලිස් සිරමැදිරිය තුළ රඳවා තැබීමට පෙර ඔවුන් පැළඳ සිටි සපත්තු සහ ඉනපටි ඉවත් කරවා අඩ නිරුවත් තත්ත්වයෙන් තැබීමට පොලිසිය කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම, සිය දරුවන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටි වින්දිත මේනකා ප්‍රියදර්ශනී සහ ඇය සමඟ සිටි වයස අවුරුදු තුනක් වූ කුඩා දරුවා ද ස්ථානාධිපතිවරයාගේ නියෝග මත පොලිස් භාරයේ රඳවා තබා ගැනීමට කටයුතු කර ඇති බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි හා සිද්ධිමය පසුබිම මඟින් තහවුරු වේ.

කෙසේ වුවද, වගඋත්තර  පද්මිණී නැමැති කාන්තා නිලධාරිනිය විසින් කොස්සකින් පහර දුන් බවට පැමිණිලිකාර පාර්ශවය විසින් එල්ල කරන ලද චෝදනාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ ද, එම පහරදීම සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් වෛද්‍ය වාර්තා හෝ ස්වාධීන සාක්ෂි  අනාවරණය නොවන බව නිරීක්ෂණය කරනු ලැබේ. ඒ අනුව, නීති විරෝධී රැඳවුම් භාරය සහ අවමන් සහගත සැලකිල්ල පිළිබඳ කරුණු සාක්ෂි මඟින් සනාථ වුව ද, පහරදීම සම්බන්ධ චෝදනාව සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු, ඔහුගේ බිරිඳ සහ දරුවන් දෙදෙනා විසින් ලබා දී ඇති ප්‍රකාශයන්හි අනුකූලතාවය පිරික්සීමේදී අනාවරණය වන්නේ, පොලිසිය විසින් මෙම සමස්ත පවුලම රඳවා තබා ගෙන ඇත්තේ පියා පොලිසිය වෙත ගෙන්වා ගැනීම සඳහා වේ. පියා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වූ පස්වරු 2.00 වන තෙක් පවුලේ සාමාජිකයන්ගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර නොගැනීම සහ ඔහු පැමිණි වහාම ඔවුන් නිදහස් කිරීම මඟින් තහවුරු වන්නේ, මෙය කිසිදු විමර්ශන අවශ්‍යතාවයක් මත සිදු කරන ලද අත්අඩංගුවට ගැනීමක් නොව, අත්තනෝමතික ලෙස බලය අවභාවිත කිරීමක් බවයි.

3. විමර්ශනයේදී අනාවරණය වූ කරුණු සහ සාක්ෂි අනුව, පළමුවන වගඋත්තර  ස්ථානාධිපතිවරයා ඇතුළු සෙසු නිලධාරීන් (02, 03 සහ 04 වගඋත්තරකරුවන්) බාලවයස්කාර දරුවන් අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තැබීම සම්බන්ධයෙන් එල්ල වී ඇති චෝදනා සහ සාක්ෂි මුල සිටම තරයේ ප්‍රතික්ෂේප කර ඇත. එසේ වුවද, පස්වන වගඋත්තර  පොලිස් සැරයන් චානක වීරසේකර මහතා විසින් පසුව ලබාදෙන ලද ප්‍රකාශය මඟින් අදාළ දරුවන් දෙදෙනා පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත්, ඔවුන්ව ස්ථානාධිපතිවරයා වෙත භාර දුන් බවත් පිළිගෙන ඇත. වගඋත්තර  පොලිස් නිලධාරීන්ගේ ප්‍රකාශයන් අතර පවතින පරස්පරතාවය මඟින් ගම්‍ය වන්නේ, සිදු වී ඇති අනීතික සහ සාපරාධී ක්‍රියාවන් යටපත් කිරීමටත්, කොමිෂන් සභාව හමුවේ සත්‍යය වසන් කිරීමටත් වගඋත්තරකරුවන් විසින් උත්සාහ කර ඇති බවයි.

4. කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විමර්ශන කටයුතු සඳහා පානදුර උතුර පොලිස් ස්ථානය වෙතින් තොරතුරු උද්ධෘත ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස 2021.11.09 සහ 2021.12.06 යන දිනයන්හි ලිඛිතව දැනුම් දී තිබුණ ද, එම වාර්තා ඉදිරිපත් කිරීමට පොලිසිය පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය වේ. අනතුරුව, 2025.01.17 වන දින පවත්වන ලද විමර්ශනයේදී

කාන්තා උප පොලිස් පරික්ෂක පද්මිණී මහත්මිය වෙත කරන ලද දැනුම්දීමකට අනුව වාර්තාවක් ඉදිරිපත් කර ඇති නමුත්, එම වාර්තාව ද 2021.06.28 දින පස්වරු 17.25 ට පෙර සටහන් වූ තොරතුරුවල මුල් පිටපත් රහිතව අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර තිබේ.

එකී වාර්තා වැඩිදුරටත් අධ්‍යයනය කිරීමේදී අනාවරණය වන්නේ, 2021.06.28 වන දින උදෑසන 06.30 ට සිදු වූ බව කියන පහරදීමේ සිදුවීමෙන් පසු තුවාලකාරිය විසින් පොලිසිය වෙත ඒ බව දැනුම් දී රෝහල්ගතව ඇති බවයි. මෙම තත්ත්වය මත, සිදුවීමට අදාළ සම්පූර්ණ කරුණු අනාවරණය කර ගැනීම සඳහා පානදුර උතුර පොලිස් ස්ථානාධිපතිවරයා වෙත 2025.03.21 සහ 2025.10.08 යන දිනයන්හි යළිත් කරන ලද දැනුම්දීම් අනුව, අදාළ උද්ධෘත සහිත වාර්තාව සහ 2021.06.27 දින සිට 2021.06.28 දක්වා වූ රැඳවුම් සටහන්වල සහතික කරන ලද පිටපත් 2025.10.07 දින කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිල්ල විමර්ශනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ සවිස්තරාත්මක වාර්තා සහ ලේඛන කොමිෂන් සභාව වෙත නියමිත දිනවල දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව පෙනී යයි. විමර්ශන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන නිසි සහයෝගය ලබා නොදීම සහ ලේඛන ඉදිරිපත් කිරීමේදී දක්වන ලද මෙම මන්දගාමී පිළිවෙත මඟින්, සිද්ධියට අදාළ සත්‍යතාවය අනාවරණය කර ගැනීමේ ක්‍රියාවලිය අනිසි ලෙස ප්‍රමාද කිරීමට වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බව නිරීක්ෂණය වේ.

4. පානදුර උතුර පොලිස් ස්ථානය විසින් ඉදිරිපත් කරන ලද විවිධ පැමිණිලි තොරතුරු පොතෙහි සඳහන් තොරතුරු අනුව, 2021.06.28 වන දින පස්වරු 17.25 ට අදාළ තුවාලකාරියගේ ප්‍රකාශය සටහන් කරගෙන ඇත. එදිනම පස්වරු 14.10 ට විමර්ශන කටයුතු සඳහා පිටත්ව ගිය උප පොලිස් පරික්ෂක ප්‍රියංකර මහතා, පස්වරු 17.35 ට සිය විභාග සටහන් ඇතුළත් කර ඇති අතර, පැමිණිලිකරු පස්වරු 18.10 ට අත්අඩංගුවට ගත් බව සටහන් කර ඇත. මෙම කාල රාමුව සැසඳීමේදී, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමටත් පෙර සිටම ඔහුගේ දරුවන් සහ බිරිඳ පොලිස් භාරයේ රඳවා තබාගෙන සිටි බවට පැමිණිලිකරු ඉදිරිපත් කරන තර්කය සනාථ වන බව නිරීක්ෂණය වේ.

5. පැමිණිලිකරුගේ දරුවන් සමඟ සිරමැදිරිය තුළ රඳවා සිටි බවට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ සාක්ෂිකරුවන් පොලිස් ස්ථානයේ රඳවා තබා ගැනීමේ ලේඛනය අනුව, අනිල් ප්‍රදීප් මොරායස් 2021.06.27 පස්වරු 22.40 සිට 2021.06.28 පස්වරු 19.30 දක්වාත්, සුසන්ත හේමන්ත 2021.06.27 පස්වරු 23:00 සිට 2021.06.28 පස්වරු 22:05 දක්වාත් සිරමැදිරිය තුළ රැඳවුම් භාරයේ සිට ඇති බව ලේඛනගතව තහවුරු වේ.

මෙම ලේඛනගත දත්තයන් සාක්ෂිකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ සමඟ සසඳන විට, ඔවුන් පවසන පරිදි 2021.06.28 දින පෙරවරු 10.00 ට පමණ බාලවයස්කාර දරුවන් දෙදෙනා සිරමැදිරිය වෙත රැගෙන එන අවස්ථාවේදීත්, පසුව දහවල් ඔවුන්ගේ පියා සිරමැදිරිය වෙත රැගෙන ආ අවස්ථාවේදීත් මෙම සාක්ෂිකරුවන් සිරමැදිරිය තුළම රැඳී සිටි බව නිරීක්ෂණය වේ.

සිද්ධිය වූ අවස්ථාවේ පානදුර උතුර පොලිස් සිරමැදිරිය තුළ රඳවා සිටි අනිල් ප්‍රදීප් මොරායස් සහ සුදත් හේමන්ත යන ස්වාධීන සාක්ෂිකරුවන් දෙදෙනාම සිය දිවුරුම් ප්‍රකාශ මඟින් සනාථ කර ඇත්තේ, බාලවයස්කාර දරුවන් දෙදෙනා සිරමැදිරිය තුළ රඳවා සිටි බවත්, ඔවුන්ගේ පියා (පැමිණිලිකරු) පොලිස් ස්ථානය වෙත පැමිණීමෙන් අනතුරුව පමණක් දරුවන් නිදහස් කිරීමට පොලිසිය කටයුතු කළ බවත්ය.

6. 2024.12.30 වන දින කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙමින් පැමිණිලිකරු විසින් , පාසල් අධ්‍යාපනය ලබන වියේ පසුවන සිය බාලවයස්කාර දරුවන් දෙදෙනා, පදිංචි ප්‍රදේශයේ ගම්වාසීන්

ඉදිරිපිටදී පොලිස් ජීප් රථයකට නංවාගෙන රැගෙන යාම හේතුවෙන් ඔවුන් සමාජීය අපකීර්තියකට සහ මානසික පීඩනයකට ලක්ව ඇති බව සඳහන් කර ඇත. මෙම අනීතික අත්අඩංගුවට ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දරුවන් පාසල් පරිශ්‍රය තුළ මෙන්ම සමවයස් කණ්ඩායම් අතර ද සමාජීය බහිෂ්කරණයකට ලක්ව ඇති අතර, ඒ හේතුවෙන් ඔවුන්ගේ අඛණ්ඩ අධ්‍යාපන කටයුතු අඩාල වී ඇති බවත් සඳහන් කර ඇත.

මෙම සිදුවීමෙන් පසු දරුවන් මානසික කම්පනයකට අපත්ව ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස පැමිණිලිකරුගේ වැඩිමහල් පුත්‍රයා සියදිවි නසා ගැනීමට පවා උත්සාහ කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. මීට පෙර කිසිදු දිනක පොලිස් වාර්තාවල වැරදිකරුවන් වී නොමැති මෙම දරුවන් සම්බන්ධයෙන්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වගඋත්තර පොලිස් පාර්ශවය පළිගැනීමේ චේතනාවෙන් කටයුතු කර ඇති බවද සඳහන් කර ඇත.

විශේෂයෙන්ම, පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසුව දරුවන් සිතාමතාම අපරාධකරුවන් ලෙස හංවඩු ගැසීමට උත්සාහ කිරීම සහ අවස්ථා කිහිපයකදීම ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම මඟින් වගඋත්තරකරුවන්ගේ පක්ෂග්‍රාහී සහ ද්වේෂසහගත හැසිරීම මනාව පිළිඹිබු වන බවත්, කොමිෂන් සභාවේ පවතින මෙම විමර්ශන කටයුතු අඩාල කිරීමේ අරමුණින්, පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා ලෙස ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකරු වෙත නිරන්තරයෙන් බලපෑම් හා තර්ජන එල්ල කිරීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත.

7. 2025.02.27 වන දින පවත්වන ලද විමර්ශනයේදී පළමුවන වගඋත්තර පානදුර උතුර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක වාර්තාව සහ ප්‍රකාශය මඟින්, අදාළ දින සිදු වූ බව කියන තියුණු ආයුධයකින් පහර දීමේ සිද්ධිය සම්බන්ධයෙන් (CIB 1 156/135) සැකකරු වූ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට නීත්‍යානුකූලව ක්‍රියා කළා මිස, කිසිදු අවස්ථාවක ඔහුගේ බිරිඳ හෝ බාලවයස්කාර දරුවන් අත්අඩංගුවට ගෙන නොමැති බව සඳහන් කර ඇත. සැකකරු පලා ගොස් සිටි කාලසීමාව තුළ ඔහුගේ නිවස පරීක්ෂා කිරීම සාමාන්‍ය විමර්ශන පටිපාටියක් බවත්, පැමිණිලිකරු පොලිසිය සමඟ පෞද්ගලික අමනාපයක් ඇති කරගෙන මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

මෙහිදී පැමිණිලිකරුගේ අපරාධ ඉතිහාසය පිළිබඳව කරුණු ලිඛිතව ඉදිරිපත් කර ඇත. ඒ අනුව, පැමිණිලිකරු RC 427487 දරන අංකය යටතේ 'දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවකු' (IRC) වශයෙන් වාර්තා වී ඇති බවත්, ඔහුට එරෙහිව 2000, 2004 සහ 2005 වර්ෂයන්හිදී නිවාස බිඳ දේපළ සොරකම් කිරීම සම්බන්ධයෙන් අධිකරණය මඟින් අත්හිටවූ සිරදඬුවම් නියම කර ඇති බවත් සඳහන් කර ඇත. තවද, මෙම පැමිණිල්ල විභාග වෙමින් පවතින අතරතුර පවා, 2024 ජූලි මස පැමිණිලිකරු සහ ඔහුගේ පුත්‍රයෙකු කඩුවලින් පහර දී තුවාල සිදු කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් (නඩු අංක 22249/24 සහ 22718/24) සැකකරුවන් වී ඇති බවත් සඳහන් කර ඇත.

මෙම තොරතුරු විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ, පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලට අදාළ වන මූලික ආරවුල පැමිණිලිකාර පාර්ශවයේ ඥාතීන් අතර ඇති වූවක් බවත්, එහිදී නඩු භාණ්ඩය ලෙස කඩුවක් නම් කර තිබුණ ද ඇස්බැස්ටස් කැබැල්ලක් වැදීමෙන් මෙම ගැටලුව හටගෙන ඇති බවත්ය. ඒ අනුව දෙපාර්ශවයම පසුව සමථයකට පත්ව අදාළ නඩු කටයුතු අවසන් කිරීමට පියවර ගෙන ඇති බවයි.

එසේ වුව ද, වගඋත්තර ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකරුගේ සහ ඔහුගේ දරුවන්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම් රටාව මෙන්ම අපරාධ ඉතිහාසය පිළිබඳ තොරතුරු ඉස්මතු කිරීමට කටයුතු කර ඇත. ඒ හරහා පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලදැයි කියනු ලබන අනීතික ක්‍රියාකලාපයන් සාධාරණීකරණය කිරීමට හෝ ඒවායේ බරපතලකම අවතක්සේරු කිරීමට වගඋත්තරකරුවන්

උත්සාහයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ. තව ද මෙම මානව හිමිකම් පැමිණිල්ල යනු පොලිසිය සිය නීත්‍යානුකූල රාජකාරි ඉටු කිරීම වැළැක්වීමට සහ නීතියෙන් බේරීමට මඟ පාදා ගැනීම සඳහා පැමිණිලිකරු විසින් ගොතන ලද පදනම් විරහිත චෝදනාවක් බවත් සඳහන් කර ඇත.

කෙසේ වුවද, පැමිණිලිකරු අපරාධ ඉතිහාසයක් සහිත පුද්ගලයෙකු වීම හෝ ඔහු ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නෙකු වීම, ඔහුගේ බාලවයස්කාර දරුවන් හෝ බිරිඳ කිසිදු නෛතික පදනමකින් තොරව අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීමට කිසිදු නෛතික අවසරයක් පොලිසිය වෙත ලබා නොදේ. ඕනෑම පුද්ගලයෙකුගේ අපරාධ පසුබිම කුමක් වුවද, පොලිසිය විසින් සිදු කරනු ලබන විමර්ශනය පවතින නීතිමය රාමුවට සහ මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව සිදු විය යුතුය. ඒ අනුව, වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලිකරුගේ පෙර වැරදි පිළිබඳ තොරතුරු, මෙම පැමිණිල්ලේ අන්තර්ගත 'නීති විරෝධී රැඳවුම් භාරය' පිළිබඳ චෝදනාව බැහැර කිරීමට ප්‍රමාණවත් නෛතික පදනමක් නොවන බව නිරීක්ෂණය වේ.

8. ඒ අනුව පැමිණිලිකරු අපරාධ විමර්ශනයකට අදාළව සැකකරුවෙකු වශයෙන් නම් කර තිබූ පසුබිමක, ඔහුව අත්අඩංගුවට ගැනීම සඳහා පදිංචි නිවස වෙත ගිය පානදුර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්, එම අවස්ථාවේ පැමිණිලිකරු නිවසේ රැඳී නොසිටීම හේතුවෙන් ඔහු වෙනුවට කිසිදු නෛතික පදනමකින් තොරව ඔහුගේ බාලවයස්කාර පුත්‍රයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. කිසිදු වරදකට සම්බන්ධ නොමැති මෙම දරුවන් දෙදෙනා පොලිස් සිරමැදිරිය තුළ රඳවා තබා ගැනීම නීති විරෝධී ක්‍රියාවක් වන අතර, එය පැමිණිලිකරු පොලිසිය වෙත ගෙන්වා ගැනීමේ අරමුණින් සිදු කරන ලද රඳවා තබා ගැනීමේ ක්‍රියාවලියක් බවත් නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරුගේ බිරිඳ සහ වයස අවුරුදු තුනක් (03) වූ බාල දරුවාට ද පොලිස් ස්ථාන පරිශ්‍රය තුළින් පිටවීමට අවස්ථාව ලබා නොදී රඳවා තබා ගනිමින්, එකී තත්ත්වය පිළිබඳව පැමිණිලි පාර්ශවය වෙත දුරකථන මාර්ගයෙන් දැනුම් දීමට පොලිසිය පියවර ගෙන ඇත. දුරකථනය හරහා සිදුකරන ලද දැනුම්දීමට අනුව පැමිණිලිකරු පස්වරු 14.00 ට පමණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වූ පසුව, එලෙස අත්අඩංගුවට ගෙන සිටි ඔහුගේ දරුවන් සහ බිරිඳ නිදහස් කිරීමට පොලිසිය කටයුතු කර තිබීම මඟින් තහවුරු වන්නේ, මෙම සමස්ත ක්‍රියාවලියම පැමිණිලිකරු වෙත මානසික බලපෑම් එල්ල කර ඔහුව නතු කර ගැනීම සඳහා සිදු කරන ලද්දක් බවයි.

කිසිදු ලිඛිත නියෝගයක් හෝ නෛතික අවශ්‍යතාවයක් නොමැතිව, සැකකරුවෙකු සොයා ගැනීම සඳහා ඔහුගේ පවුලේ සාමාජිකයන් සහ බාලවයස්කාර දරුවන් මෙලෙස අත්අඩංගුවට හා රඳවා තබා ගැනීම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති පුද්ගල නිදහස සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලට එරෙහි මූලික අයිතිවාසිකම් මෙන්ම ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය වේ.

9. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් මඟින් සහතික කර ඇති පරිදි, කිසිදු තැනැත්තෙකු නීත්‍යානුකූල පදනමකින් තොරව අත්අඩංගුවට ගැනීම හෝ රැඳවුම් භාරයේ තැබීම සිදු නොකළ යුතුය. මෙම සිදුවීමට අදාළව වින්දිත බාලවයස්කාර දරුවන් දෙදෙනා අත්අඩංගුවට ගැනීම සඳහා වගඋත්තරකරුවන් සතුව කිසිදු ලිඛිත හෝ වාචික නීත්‍යානුකූල නියෝගයක් පැවති නොමැති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, 'අදාළ දරුවන් අත්අඩංගුවට ගැනීමට තමා කිසිදු නියෝගයක් ලබා දී නොමැති බව' පළමුවන වගඋත්තරකාර ස්ථානාධිපති සංජීව ලක්මාල් මහතා සිය ප්‍රකාශය මඟින් සඳහන් කර තිබුණ ද, පස්වන වගඋත්තරකරු විසින් එම දරුවන් දෙදෙනා පොලිස් ස්ථානය වෙත රැගෙන විත් ස්ථානාධිපතිවරයාට භාර දුන් බවට කරන ලද ප්‍රකාශය තුළින් වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් අතර පවතින පරස්පරතාවය පිළිඹිබු වේ.

වගඋත්තරකරුවන්ගේ මෙම පරස්පර ප්‍රකාශයන් මගින් මෙම සමස්ත අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලිය තුළ පවතින අනීතික සහ අත්තනෝමතික ස්වභාවය තවදුරටත් තහවුරු වේ.

එසේම වගඋත්තර ස්ථානාධිපතිවරයා 2025.02.27 දින ලබාදුන් ප්‍රකාශය මගින් සැකකරු සහ නඩු භාණ්ඩ අත්අඩංගුවට ගැනීමට තමා විසින් උපදෙස් ලබා දුන් බව පිළිගෙන ඇත. තව ද, 2021.06.28 දිනැති පොලිස් පිටවීමේ සටහන් පිරික්සීමේදී, නිලධාරීන් කණ්ඩායම ස්ථානාධිපතිවරයාගේ පූර්ණ අනුමැතිය සහ අවසරය මත පොලිස් ජීප් රථයෙන් අදාළ ස්ථානය වෙත පිටව ගොස් ඇති බව නිරීක්ෂණය වේ. මෙවැනි පසුබිමක, මෙම සිදුවීම සම්බන්ධයෙන් තමා කිසිදු දැනුවත්භාවයකින් පසු නොවූ බවට ස්ථානාධිපතිවරයා ඉදිරිපත් කරන තර්කය පවතින ලේඛනගත සාක්ෂි හමුවේ විශ්වසනීය නොවන බව පෙනී යයි. ඒ අනුව, අධීක්ෂණ වගකීම ප්‍රකාරව මෙම ක්‍රියාව සම්බන්ධයෙන් වන වගකීමෙන් බැහැර වීමට ස්ථානාධිපතිවරයාට නෛතික හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ.

10.පොලිස් දෙපාර්තමේන්තු නියෝග අංක A20 (5)(D) මගින් පනවා ඇති ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුව, සිරභාරයට ගනු ලබන ළමා හෝ තරුණ පුද්ගලයන් කිසිදු හේතුවක් මත වැඩිහිටි රැඳවියන් සමඟ එකම සිරමැදිරියක රඳවා නොතැබිය යුතු අතර, ඔවුන්ට වැඩිහිටි රැඳවියන් ආශ්‍රය කිරීමට පවා ඉඩ නොදිය යුතුය. මෙම සිද්ධියේ වින්දිත දරුවන් දෙදෙනා පිළිවෙළින් වයස අවුරුදු 17 සහ 15 යන බාලවයස්කාර මට්ටම්වල පසුවන්නන් වුවද, ඔවුන් වැඩිහිටි සිරකරුවන් සමඟ එකම සිරමැදිරියක රඳවා තැබූ බවට ඉදිරිපත් වූ දිවුරුම් ප්‍රකාශ සහ සාක්ෂි මගින් සනාථ වේ. වගඋත්තරකරුවන් විසින් සිදු කරන ලද මෙම ක්‍රියාව මූලික අයිතිවාසිකම් මෙන්ම ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස නිරීක්ෂණය වේ.

11. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (UNCRC) 19 සහ 37(b) වගන්ති මගින් අවධාරණය කර ඇති "ළමයින් ඕනෑම ආකාරයක අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකින් ආරක්ෂා කළ යුතුය" යන ජාත්‍යන්තර මානුෂීය ප්‍රමිතීන්ට මෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් සහතික කර ඇති වධහිංසාවලින් නිදහස් වීමේ අයිතිවාසිකමට ද පටහැනිව සිදු කරන ලද ක්‍රියාවක් බව නිරීක්ෂණය වේ. ඒ අනුව, සැකකරුවෙකු සොයා ගැනීම සඳහා ඔහුගේ පවුලේ සාමාජිකයන් 'ප්‍රාණ ඇපකරුවන්' ලෙස භාවිතා කරමින් ඔවුන් වෙත මෙලෙස අවමන් සහගත ලෙස සැලකීම කිසිදු නීති පද්ධතියක් තුළ අනුමත කළ නොහැකි තත්වයකි.

12. <u>බන්දුල සමරසේකර එදිරිව විජිත අල්විස්, ඕ.අයි.සී ගිනිගත්හේන පොලිස් ස්ථානය (S.C.(FR) 107/2007</u> දක්වා සිටියේ " පොලිස් නිලධාරියෙකුගේ යුතුකම වන්නේ ඔහුගේ උපරිම උත්සහාය සහ හැකියාව සියලු අපරාධ වැරදි හා මහජන පීඩා වැලැක්වීමට සහ වඩාත් වැදගත් ලෙස සාමය ආරක්ෂා කිරීමට භාවිතා කිරීම බවත් ඔහුගේ රාජකාරිය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටු කිරීමට නම් මහජනතාවගේ විශ්වාසය හා ගෞරවය රඳවා තබා ගත යුතු බවත් මහජනතාවගෙන් එවැනි විශ්වාසයක් හා ගෞරවයක් ලබා ගැනිමට නම් සාමාන්‍ය පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තුවනවාට වඩා උසස් සාදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් පොලිස් නිලධාරියෙකු සතු විය යුතු බවත්ය.

13. තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේ දැයි අධීක්ෂණය කිරීමට උසස් නිලධාරීන්ට යුතු කමක් ඇති බවත්, තම අධීක්ෂණයට යටත් වන නිලධාරීන්ගේ හැසිරීම සියුම් ලෙස නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ යුතුකමක් බවත්, යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන්ද එම මූලික අයිතිවාසිකම් කඩ කිරීමට වගකිව යුතු බවත්, වගවීමකට යටත් නොකිරීම මගින් දණ්ඩ මුක්තියේ පරිසරයක් ඇති කරන බවත්, එවැනි නිලධාරීන්ට විනය පියවර නොගැනීම මගින් නීතිය ඉදිරියේ සමානව සැලකීම උල්ලංඝනය කිරීමක් බවත් තුරෙයි රාජා විනිසුරුතුමා විසින් <u>ආර්.ජේ.ඉරේෂා ලක්මාලි එ. නෙවිල් සිල්වා හා තවත් අය, කොළඹ අපරාධ කොට්ඨාශය (SCFR/505/19)</u> නඩුවේ දී දක්වා ඇත.

14. **ගනේෂන් සැම්සන් රෝයි. එදිරිව - එම්.එම්.ජනකු මාරසිංහ. ස්ථානාධිපති අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව SCFR 405/2018** නඩුවේදී ද දක්වා ඇත්තේ චෝදනාව විශ්වාස කළ හැකි බවට මතයක් ගොඩනගා නොගෙන, ලැබුණු පැමිණිල්ලක් මතම යාන්ත්‍රිකව අත්අඩංගුවට ගැනීමක් පොලිස් නිලධාරීන්ට කල නොහැකි බවත්, පැමිණිල්ල විශ්වාස කල හැකිද නැතහොත් ලබා දී ඇති තොරතුරු විශ්වාසදායකද යන්න තහවුරු කර ගැනීමට කරුණු පැහැදිලි නම් මිස අවශ්‍ය විමර්ශන සිදු කිරීමට පොලිස් නිලධාරින් ක්‍රියාත්මක විය යුතු බවයි.

15. **ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී එදිරිව වරුණ බෝගහවත්ත සහ වෙනත් අය (SCFR 677/2012)** නඩුවේදී, "1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, යම් හෙයකින් නිදහස අහිමි කරන්නේ නම් නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට නියෝග කරයි. මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන සකසා ඇත්තේ අභිමතය පරිදි හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම වැළැක්විට සහ පුද්ගල වාසි සහ දේශපාලන අරමුණු සඳහා අධිකරණ බලය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීමට " බව දක්වා ඇත.

16. එසේම, **කපු ගීකියනගේ එදිරිව හෙට්ටිආරච්චි සහ වෙනත් අය (1984) 2 Sri L.R. 153** නඩුවේදී" අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සඳහන් නීතිය මගින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය හැර වෙනත් ක්‍රියාපටිපාටියක් යොදාගත නොහැක " යනුවෙන් දක්වා ඇත.

**නිගමනය**

පැමිණිලිකරු වන සිංගප්පුලිගේ චමින්ද කුමාර ප්‍රනාන්දු මහතාට එරෙහිව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අදාළව ඔහුව අත්අඩංගුවට ගැනීමට ගිය අවස්ථාවේ ඔහු නිවසේ රැඳී නොසිටීම හේතුවෙන්, ඔහුව පොලිස් ස්ථානය වෙත ගෙන්වා ගැනීමට බලකිරීමේ අරමුණින් වගඋත්තර නිලධාරීන් විසින් ඔහුගේ බාලවයස්කාර පුත්‍රයන් දෙදෙනා වන උදාර සඳකැලුම් (වයස 17) සහ චතුර සඳරුවන් (වයස 15) යන දෙදෙනාව කිසිදු නෛතික පදනමකින් තොරව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන, ඔවුන්ව පොලිස් ජීප් රථයකින් රැගෙන ගොස් සාමාන්‍ය අපරාධකරුවන් රඳවන සිරමැදිරිය තුළ රඳවා තැබීම මගින්, බාලවයස්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කිසිදු නෛතික ක්‍රියා පටිපාටියක් හෝ පොලිස් දෙපාර්තමේන්තු නියෝග වගඋත්තර කරුවන් විසින් අනුගමනය කර නොමැති බව සාක්ෂි මගින් පැහැදිලි වේ.

තවද, සිය දරුවන් පිළිබඳව විමසීමට පොලිස් ස්ථානය වෙත ගිය මේනකා ප්‍රියදර්ශනී මහත්මිය සහ වයස අවුරුදු තුනක් (03) වූ බාල දරුවාව ද, දෙවන වගඋත්තර කාරිය සිරමැදිරිය අසල රඳවා තබා ගැනීම තුළින් පෙනී යන්නේ මෙය සැලසුම් සහගතව සිදු කරන ලද රඳවා ගැනීමේ ක්‍රියාවලියක් බවයි. මෙම සමස්ත සිදුවීම් දාමය පැමිණිලිකරුගේ පවුලේ සාමාජිකයන්ගේ අනුකූල සාක්ෂි මගින් පමණක් නොව, එම අවස්ථාවේ සිරමැදිරියේ සිටි ස්වාධීන සාක්ෂිකරුවන් දෙදෙනෙකු සහ වෙනත් සාක්ෂිකරුවන්ගේ දිවුරුම් ප්‍රකාශ මගින් ද තහවුරු වේ.

වගඋත්තර පොලිස් නිලධාරීන් මෙම අත්අඩංගුවට ගැනීම් ප්‍රතික්ෂේප කළ ද, ඔවුන් ඉදිරිපත් කළ වාර්තා අසම්පූර්ණ වීම සහ නිල ලේඛනවලින් මෙම තොරතුරු වසන් කිරීමට උත්සාහ කර තිබීම මෙන්ම, පස්වන වගඋත්තරකරු දරුවන් පොලිසියට රැගෙන ආ බව පිළිගැනීමෙන් වගඋත්තර කරුවන්ගේ සමස්ත කරුණු දැක්වීමේ විශ්වාසනීයත්වය බිඳ වැටේ. බාලවයස්කාර දරුවන් මෙලෙස අත්අඩංගුවට ගෙන රඳවා තැබීම හේතුවෙන් ඔවුන් අපකීර්තිය හා මානසික පීඩනයට ලක්ව ඇති බව පෙනීයයි. පැමිණිලිකරුට එරෙහිව පවතින පෙර වැරදි හෝ අපරාධ වාර්තා, ඔහුගේ බිරිඳ හෝ දරුවන් නීති විරෝධී රැඳවුම් භාරයට ගැනීමට කිසිදු නෛතික සාධාරණීකරණයක් ලෙස සැලකිය නොහැකිය.

ඒ අනුව සැකකරුවෙකු වූ පැමිණිලිකරුව පොලිස් ස්ථානය වෙත ගෙන්වා ගැනීමේ අරමුණින්, කිසිදු වරදකට සම්බන්ධ නොවූ ඔහුගේ බාලවයස්කාර දරුවන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන වැඩිහිටි රැඳවියන් සමඟ සිරමැදිරියක රඳවා තැබීම තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති *'කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය'* යන මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇත.

මෙම අනීතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තැබීම සඳහා අවශ්‍ය නියෝග ලබාදීම සම්බන්ධයෙන් පළමුවන වගඋත්තර පානදුර උතුර පොලිස් ස්ථානාධිපති සංජීව ලක්මාල් යන අය ද, පැමිණිලිකරුගේ බාලවයස්කාර දරුවන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන රඳවා තැබීමේ ක්‍රියාවලිය සඳහා සෘජුව දායක වූ තෙවන වගඋත්තර උ.පො.ප. ප්‍රියංකර, සිව්වන වගඋත්තර උ.පො.ප. සෙනවිරත්න සහ පස්වන වගඋත්තර පො.සැ. 44659 වීරසේකර යන නිලධාරීන් ද වගකිව යුතුය.

ඒ අනුව, පළමු, තෙවන, සිව්වන සහ පස්වන වගඋත්තර නිලධාරීන් විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව *'කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය'* සහ 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් මඟින් සහතික කර ඇති *'අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් සහ රඳවා තැබීමෙන් නිදහස් වීමේ'* අයිතිය ද, 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව *'නීතිය ඉදිරියේ සමාන සැලකිලි ලැබීමේ සහ නීතියේ සමාන ආරක්ෂාව ලැබීමේ'* මූලික අයිතිවාසිකම ද උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

දෙවන වගඋත්තර කාන්තා උ.පො.ප. පද්මිණී යන නිලධාරිනියට එරෙහිව එල්ල වී ඇති පහරදීමේ චෝදනාව සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි හෝ වෛද්‍යමය සාධක මෙම විමර්ශනයේදී අනාවරණය නොවන බැවින්, එම චෝදනාව සම්බන්ධයෙන් ඇය වගකීමෙන් බැඳෙන්නේ නැති බව නිගමනය කරනු ලැබේ.

හයවන වගඋත්තර නිලධාරියා අදාළ සිදුවීම වූ කාලසීමාව තුළ පොලිස් ස්ථානයේ රාජකාරියේ නිරතව නොසිටි බව කරුණු මඟින් තහවුරු වන බැවින්, ඔහු මෙම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ වගකීමෙන් නිදහස් වන බව නිගමනය කරමු.

ඒ අනුව පහත නිර්දේශ ඉදිරිපත් කර සිටී

1. මෙම බාලවයස්කාර දරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා නියෝග ලබාදීම සහ බාල වයස්කරුවන් සිරමැදිරියේ අනෙකුත් සිරකරුවන් සමඟ රඳවා තැබීමෙන් හා නිසි අධීක්ෂණ වගකීම පැහැර හැරීම තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 13(1), 13(2) සහ 12(1) ව්‍යවස්ථාවන් උල්ලංඝණය කිරීම වෙනුවෙන් පළමුවන වගඋත්තර පානදුර උතුර හිටපු පොලිස් ස්ථානාධිපති සංජීව ලක්මාල් විසින් රු. 50,000/- මුදලක් වින්දිතයන් වෙත ගෙවිය යුතුය.

2. බාලවයස්කාර දරුවන් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට ක්‍රියාකිරීම හා සිර කුඩුවේ රඳවා තැබීම දායක වීම තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 13(1), 13(2) සහ 12(1) ව්‍යවස්ථාවන් උල්ලංඝණය කිරීම වෙනුවෙන් තෙවන වගඋත්තර උ.පො.ප. ප්‍රියංකර රු. 50,000/- මුදලක් ද , සිව්වන වගඋත්තර උ.පො.ප. සෙනවිරත්න රු. 25,000/- මුදලක් ද සහ පස්වන වගඋත්තර පො.සැ. 44659 වීරසේකර රු. 10,000/- මුදලක් ද වින්දිත පාර්ශවය වෙත ගෙවිය යුතුය. (පො.සැ. 44659 වීරසේකර අත්අඩංගුවට ගැනීම සම්බන්ධව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම ද අවධානයට ගන්නා ලදී)

3. පළමුවන වගඋත්තර පානදුර උතුර පොලිස් ස්ථානාධිපති සංජීව ලක්මාල්, තෙවන වගඋත්තර උ.පො.ප. ප්‍රියංකර, සිව්වන වගඋත්තර උ.පො.ප. සෙනවිරත්න සහ පස්වන වගඋත්තර පො.සැ. 44659 වීරසේකර යන නිලධාරීන්ට එරෙහිව, වින්දිතයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම, පොලිස් බලතල අත්තනෝමතික ලෙස පරිහරණය කිරීම සහ පොලිස් දෙපාර්තමේන්තු නියෝග උල්ලංඝනය කිරීම යන කරුණු පදනම් කරගෙන පරීක්ෂණයක් පවත්වා එම නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලිස්පතිවරයා වෙත දැනුම් දෙමු.

2026 .07. 30 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

01. අමාත්‍යතුමා
ආරක්ෂක අමාත්‍යාංශය,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ. - කරුණු දැන ගැනීම සඳහා

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 02. - නිර්දේශය ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා

සැ.යු. : අදාළ වන්දි මුදල "මුදල් ඇණවුමක්" මඟින් ගෙවා එහි පිටපත කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුයි.